# ශ්‍රී ජයවර්ධනපුර විශ්වවිද්‍යාලය, ශ්‍රී ලංකාව

## බාහිර උපාධි හා විස්තාරිත පාඨමාලා ඒකකය

# බාහිර උපාධි පාඨමාලා සඳහා ලියාපදිංචි කිරීම - 2022

ශ්‍රීජයවර්ධනපුරවිශ්වවිද්‍යාලයීය බාහිර උපාධි හා විස්තාරිත පාඨමාලා ඒකකය මගින් පවත්වනු ලබන පහත සඳහන් බාහිර උපාධි පාඨමාලා සඳහා සිසුන් ලියාපදිංචි කිරීමට තෝරා ගැනීම පිණිස සුදුසුකම්ලත් අයදුම්කරුවන්ගෙන් 2022.10.30 වන දින දක්වා අයදුම්පත් කැඳවනු ලැබේ.

**මානව ශාස්ත්‍ර හා සමාජීය විද්‍යා පීඨය මගින් ඉදිරිපත් කරනු ලබන බාහිර උපාධි පාඨමාලා**

1. ශාස්ත්‍රවේදී (සාමාන්‍ය) බාහිර උපාධි පාඨමාලාව
2. සමාජීය විද්‍යාවේදී පාරිසරික හා සංවර්ධන අධ්‍යයන (සාමාන්‍ය) බාහිර උපාධි පාඨමාලාව
3. ශාස්ත්‍රවේදී ඉංග්‍රීසි (සාමාන්‍ය) බාහිර උපාධි පාඨමාලාව

**කළමනාකරණ අධ්‍යයන හා වාණිජ විද්‍යා පීඨය මගින් ඉදිරිපත් කරනු ලබන බාහිර උපාධි පාඨමාලා**

1. වාණිජවේදී (සාමාන්‍ය) බාහිර උපාධි පාඨාමාලාව
2. විද්‍යාවේදී කළමනාකරණ (රාජ්‍ය) සාමාන්‍ය (බාහිර) උපාධි පාඨාමාලාව
3. විද්‍යාවේදී ව්‍යාපාර අධ්‍යයන (සාමාන්‍ය) බාහිර උපාධි පාඨමාලාව

එක් එක් පාඨමාලාවට අදාළ තොරතුරු external.sjp.ac.lk යන වෙබ් අඩවියෙහි සඳහන් වේ.

**අයදුම්පත් ඉදිරිපත් කිරීමේ ක්‍රමවේදය**

1. අයදුම්පත් යොමු කල හැක්කේ මාර්ගගත ක්‍රමවේදය (Online) ඔස්සේ පමණි. ඒ අනුව external.sjp.ac.lk වෙබ් අඩවියට පිවිස නියමිත පරිදි සම්පූර්ණ කරන ලද අයදුම්පත යොමු කළ (Submit) යුතුය.
2. අයදුම්පත් යොමු කිරීමේදී පහත සඳහන් ලේඛන ස්කෑන් කර (Scan) උඩුගත කළ යුතුය.
   i. සහතික කරන ලද උප්පැන්න සහතිකයේ පිටපතක්
   ii. අධ්‍යාපන සහතිකවල සහතික කරන ලද පිටපත්.
   iii. ජාතික හැඳුනුම්පතේ සහතික කරන ලද පිටපතක්.
   iv. බැංකුවට මුදල් ගෙවන ලද රිසිට්පතේ මුල් පිටපත.
3. ඉහත 2 හි සඳහන් ලේඛනවල පිටපත් සමග සම්පූර්ණ කරන ලද අයදුම්පතෙහි පිටපතක් (Hard Copy) පහත සඳහන් ලිපිනයට 2022.10.30 දින හෝ ඊට පෙර ලියාපදිංචි තැපෑලෙන් එවිය යුතුය.

   (සැ. යු. ලියුම් කවරයේ වම්පස ඉහළ කෙළවර තමා ඉල්ලුම් කරන උපාධි පාඨමාලාවේ නම සඳහන් කර එවිය යුතුය)
4. ඔබ විසින් අයදුම් කිරීමට අපේක්ෂිත උපාධි පාඨමාලාව සඳහා ශ්‍රී ජයවර්ධනපුර විශ්වවිද්‍යාලයේ බාහිර උපාධි හා විස්තාරිත පාඨමාලා ඒකකයේ, ගංගොඩවිල, මහජන බැංකු ශාඛාවේ පහතින් දක්වා ඇති ගිණුම් අංකවලට බැර වන පරිදි දිවයිනේ ඕනෑම මහජන බැංකු ශාඛාවකට රු. 3,000/= මුදලක් (ආපසු නොගෙවන) ගෙවා ලබාගත් රිසිට්පතෙහි මුල් පිටපත අයදුම්පත සමග ඉදිරිපත් කළ යුතුය. ඔබ ඉල්ලුම් කිරීමට අපේක්ෂිත බාහිර උපාධි පාඨමාලාවට අදාළව පහත සඳහන් ගිණුම් අංකයට පමණක් මුදල් ගෙවීම අනිවාර්ය වේ. (බැංකු රිසිට්පතේ ඡායා පිටපතක් ළඟ තබාගත යුතු වේ)

| | උපාධි පාඨමාලාව | ගිණුම් අංකය |
|---|---|---|
| 1 | ශාස්ත්‍රවේදී (සාමාන්‍ය) බාහිර උපාධි පාඨමාලාව | 072010007119 |
| 2 | සමාජීය විද්‍යාවේදී පාරිසරික හා සංවර්ධන අධ්‍යයන (සාමාන්‍ය) බාහිර උපාධි පාඨමාලාව | 072010007069 |
| 3 | ශාස්ත්‍රවේදී ඉංග්‍රීසි (සාමාන්‍ය) බාහිර උපාධි පාඨමාලාව | 072010007028 |
| 4 | වාණිජවේදී (සාමාන්‍ය) බාහිර උපාධි පාඨමාලාව | 072010007036 |
| 5 | විද්‍යාවේදී කළමනාකරණ (රාජ්‍ය) සාමාන්‍ය (බාහිර) උපාධි පාඨමාලාව | 072010007051 |
| 6 | විද්‍යාවේදී ව්‍යාපාර අධ්‍යයන (සාමාන්‍ය) බාහිර උපාධි පාඨමාලාව | 072010007127 |

**අයදුම්කරුවන් සඳහා උපදෙස්**

- ❖ ශ්‍රී ජයවර්ධනපුර විශ්වවිද්‍යාලයේ බාහිර උපාධි හා විස්තාරිත පාඨමාලා ඒකකයට අනුබද්ධ කිසිදු නියෝජිත ආයතනයක් නොමැත. එබැවින් අයදුම්පත් ඉදිරිපත් කිරීම සඳහා external.sjp.ac.lk යන වෙබ් අඩවියට පිවිස උක්ත සඳහන් ක්‍රමවේදය පමණක් අනුගමනය කළ යුතුය. වෙනත් නියෝජිතායතන හරහා ඉදිරිපත් කරන අයදුම්පත් පිළිබඳව විශ්වවිද්‍යාලය වගකියනු නොලැබේ.
- ❖ ප්‍රමාද වී ලැබෙන සහ අසම්පූර්ණ අයදුම්පත් ප්‍රතික්ෂේප කරනු ලැබේ.
- ❖ එක් අයදුම්කරුවකුට උපාධි පාඨමාලා කිහිපයකට අයදුම් කළ හැකිය. ඒ සඳහා වෙන් වෙන්ව අයදුම්පත් යොමු කළ යුතුය.

**අයදුම්පත් යොමු කළ යුතු ලිපිනය : නියෝජ්‍ය ලේඛකාධිකාරී,**
**බාහිර උපාධි හා විස්තාරිත පාඨමාලා ඒකකය,**
**ශ්‍රී ජයවර්ධනපුර විශ්ව විද්‍යාලය,**
**තැ. පෙ. අංක 10, ගංගොඩවිල, නුගේගොඩ.**

**ලේඛකාධිකාරී,**
**ශ්‍රී ජයවර්ධනපුර විශ්වවිද්‍යාලය,**
**2022.09.25**